# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. SPLG/MT/A/MaliPS/05/2022/28

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 17 දින

22 MAY 2023

මාලිම්බඩ 1977

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති කාර්යාලය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය,
ගාල්ල.

ලේකම්,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්. ද සොයිසා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල

එච්.එම්. ද සොයිසා,
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

පිටපත :- පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන කොමසාරිස් කාර්යාලය, ගාල්ල.

කළමණාකරණ
සභාව අනුමත කළා
මිළඟ කමිටුව නිර්දේශ කළා
2023/07/04
සභාපති / ලේකම්

MPS/02/06


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk


Scanned with CamScanner

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. SPLG/MT/A/MaliPS/05/2022/28

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 17 දින

ලේකම්,

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

Scanned with CamScanner

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සභාව සතු රු.625,000 ක් වටිනා කැබ් රථයක් භාවිතයෙන් ඉවත් කර තිබූ නමුත් මේවන තෙක් අපහරණය කර නොතිබූ අතර මෙතෙක් එහි වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සභාව සතු ගොඩනැගිලි සංවර්ධනය කිරීම සඳහා වැය කරන ලද රු. 1,522,918 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) 2020 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබූ පාතේගම කොතේගෙදරවත්ත පාර සංවර්ධනයට අදාළ ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.48,627 ක මුදල සඳහා කර්මාන්ත ණයගැති ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේදී ලද රු.53,100 ක් වූ දැන්වීම් පුවරු ගාස්තු සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු විවිධ වියදම් රු.134,083 ක් වෙනුවෙන් විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලස්වා නොතිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයේදී සභාව විසින් ඉටු කරන ලද ව්‍යාපෘතීන් 02 ක් වෙනුවෙන් ගෙවිය යුතු වියදම වෙනුවෙන් දෙවරක් ණයහිමි ප්‍රතිපාදන සලසා තිබීම නිසා ණයහිමි ශේෂ රු.834,091 ක් වැඩියෙන් දැක්වුණි.

(උ) ඉකුත් වර්ෂයේදී සභාව විසින් ඉටු කරන ලද විවිධ ව්‍යාපෘතීන් සඳහා ගෙවිය යුතු වියදම වෙනුවෙන් රු.907,071 ක් වැඩිපුර ප්‍රතිපාදන සලස්වා තිබුණි.



Scanned with CamScanner

(ඍ) ඉකුත් වර්ෂයේදී සභාව සතු ගල්ඇන්දකුට්ටිය ප්‍රජාශාලාව ඉදිකිරීම වෙනුවෙන් දරන ලද වියදම සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධනිත කිරීමේදී රු.568,145 ක් වැඩිපුර දැක්වීම නිසා ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට ඉකුත් වර්ෂයට අදාළව ලැබිය යුතු මුද්දර ගාස්තු රු.15,511,550 ක් ලැබිය යුතු ආදායම යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයට 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සභාවේ අනියම්/ ආදේශක සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු සේවා නියුක්තයන්ගේ අරමුදලේ 3% දායකත්වය වෙනුවෙන් රු.316,500 ක් ණයහිමි ප්‍රතිපාදන සලස්වා නොතිබුණි.

(ඔ) ස්ථාවර වත්කම් ස්වරූපයේ නොවන රු.107,040 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අයිතම 29 ක් දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂය අවසානයට සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 12 කින් අය විය යුතු රු.316,500 ක් ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ක) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.348,309,259 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාල ශේෂයන් හා ඊට අදාල උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.1,027,653 ක අසමානතා පැවතුණි.

(ග) අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.5,272,465 ක් වූ ගිණුම් විෂයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.



Scanned with CamScanner

(ඌ) ඉකුත් වර්ෂයේදී සභාව සතු ගල්ඇන්දකුට්ටිය ප්‍රජාශාලාව ඉදිකිරීම වෙනුවෙන් දරන ලද වියදම සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධනිත කිරීමේදී රු.568,145 ක් වැඩිපුර දැක්වීම නිසා ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට ඉකුත් වර්ෂයට අදාළව ලැබිය යුතු මුද්දර ගාස්තු රු.15,511,550 ක් ලැබිය යුතු ආදායම යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයට 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සභාවේ අනියම්/ ආදේශක සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු සේවා නියුක්තයන්ගේ අරමුදලේ 3% දායකත්වය වෙනුවෙන් රු.316,500 ක් ණයහිමි ප්‍රතිපාදන සලස්වා නොතිබුණි.

(ඔ) ස්ථාවර වත්කම් ස්වරූපයේ නොවන රු.107,040 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අයිතම 29 ක් දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂය අවසානයට සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 12 කින් අය විය යුතු රු.316,500 ක් ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ක) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.348,309,259 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාල ශේෂයන් හා ඊට අදාල උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.1,027,653 ක අසමානතා පැවතුණි.

(ග) අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.5,272,465 ක් වූ ගිණුම් විෂයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.



Scanned with CamScanner

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.



Scanned with CamScanner

මා විසින් වෘත්තිය විනිශ්වය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.



Scanned with CamScanner

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 අනුකූල නොවීම

### 1.6..1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 33 | වරිපනම් බදු ගෙවීම පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තුව සහ දේපළ තහනම් කිරීමේ වරෙන්තු පිළියෙල කර නොතිබුණි. |
| (ii) රීති 143 | ආපසු ගෙවිය යුතු තැන්පත් ලෙජරය මාසිකව තුලනය කර ශේෂයේ එකතුව ප්‍රධාන ලෙජර් ගිණුම සමඟ ගැලපීම් කර නොතිබුණි. |
| (iii) රීති 164 | සභාවේ ගිණුම් ලියකියවිලි ලේකම් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දිනපතා පරීක්ෂා කර ඒ බවට කෙටි අත්සන් තබා තහවුරු කළ යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |



Scanned with CamScanner

| | | |
|---|---|---|
| (iv) | රීති 217 | ඉඩම් හා ගොඩනැඟිලි ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (v) | රීති 218 | සමාලෝචිත වර්ෂයට අදාලව ඉඩම් හා ගොඩනැඟිලි සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය
--------------------------

| | |
|---|---|
| මු.රෙ. 104 (4) | 2022 වර්ෂයේදී සභාවේ බැකෝ ලෝඩරයට සිදු වූ අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.104(4) ප්‍රකාරව අවසන් වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු.8,459,120 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු.9,740,481 ක් විය.



Scanned with CamScanner

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,935,700 | 262,074 | 304,902 | 132,894 | 3,934,500 | 993,730 | 942,960 | 175,722 |
| (ii) | කුලී | 7,647,500 | 2,883,350 | 3,481,238 | 228,401 | 6,721,000 | 2,467,485 | 2,155,375 | 826,289 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 907,000 | 1,239,140 | 1,337,940 | 128,200 | 777,000 | 991,425 | 902,425 | 227,000 |
| (iv) | වෙනත් ආදායම් | 4,626,400 | 4,223,865 | 4,518,905 | 200,432 | 7,864,400 | 4,668,375 | 4,172,903 | 495,472 |
| | | 17,116,600 | 8,608,429 | 9,642,985 | 689,927 | 19,296,900 | 9,121,015 | 8,172,663 | 1,724,483 |



Scanned with CamScanner

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත ආදායම රු.17,116,600ක් විය. සමාලෝචිත වර්ෂයේ ආරම්භයට තිබූ රු.1,724,483 හිඟ මුදල හා බිල් කිරීම් රු.8,608,429 ක් සමඟ රු.10,332,912 ක් අයවීමට තිබූ අතර වර්ෂය තුළදී මුළු අයවීම් රු.9,642,985 වීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය විය යුතු හිඟ මුදල රු.689,927 ක් විය.

### 2.2.3 වරිපනම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් ශේෂය රු.168,919 ක් වූ අතර, වරිපනම් ඒකක 421 කට අදාලව වර්ෂය තුලදී බිල් කිරීම් රු.257,528 ක් සමඟ රු. 426,447 ක් අය විය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම රු. 301,902 ක් වීම නිසා වර්ෂය අවසානයට වරිපනම් ඒකක 116 කට අදාලව රු. 124,545 ක හිඟ ශේෂයක් පැවතුණි. ඉන් රු. 1,000ට වැඩි හිඟ ශේෂ පැවති වාණිජ ඒකක 40 ක් හා වාණිජ නොවන ඒකක 56 ක් පැවතුණි. ඒවායේ ප්‍රතිශතය මුළු හිඟ ඒකක සංඛ්‍යාවෙන් පිළිවෙලින් සියයට 34 ක් හා 48 ක් විය.

(ආ) හිඟ වරිපනම් ඒකක වෙනුවෙන් දේපළ තහනම් කිරීම හා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සභාව කටයුතු කර නොතිබීම මෙම හිඟ ශේෂ පැවතීමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) පසුගිය වර්ෂ 02 ක හිඟ ආදායම් අයවීමේ සාමාන්‍ය ප්‍රතිශතය සියයට 53 ක් හා 55 ක් ව පැවති අතර ඒ අනුව එම කාලපරිච්ඡේදයට අදාලව හිඟ ආදායම් අයකර ගැනීමේ සාමාන්‍ය ප්‍රතිශතය පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(ඈ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තිය ප්‍රකාර සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයන් හඳුනාගෙන 2022 සැප්තැම්බර් 30 දිනැති අංක 2300 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාල ප්‍රදේශවලින් වරිපනම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.



Scanned with CamScanner

### 2.2.4 කුලී

-----

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ කුලී ශේෂය රු.826,289ක් වූ අතර වර්ෂයේ බිල් කිරීම රු.826,289 ක් ඇතුලත්ව රු.3,709,639 ක් අය විය යුතුව තිබුණි. වර්ෂය තුලදී අයවීම රු.3,481,238 ක් වීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රු.228,401 ක හිඟ ශේෂයක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට සභාව සතු කඩ කාමර 43 ක් පැවති අතර කඩ කාමර 14 කින් රු.160,650 ක හිඟ ආදායමක් අය විය යුතුව පැවතුණි. ඉන් කඩ කාමර 03 කින් රු. 25,000 ට වඩා වැඩි ශේෂයක් අය විය යුතුව පැවතුණි.

(ඇ) පසුගිය වර්ෂ 03 ක කඩ කාමර බිල්කළ ආදායම හා රැස් කළ ආදායම අනුව ආදායම අයවීමේ ප්‍රතිශතය සියයට 58 ක් හා සියයට 89 ක් අතර පරාසයක පැවති අතර කඩකුලී අයවීමේ ප්‍රතිශතය වැඩිකර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ඈ) පසුගිය වර්ෂ 03 ක හිඟ ආදායම් අයවීමේ සාමාන්‍ය ප්‍රතිශතය සියයට 15 ත් සියයට 71 ත් අතර පරාසයක පැවති අතර ඒ අනුව එම කාලපරිච්ඡේදයන්ට අදාලව හිඟ ආදායම් අයකර ගැනීමේ සාමාන්‍ය ප්‍රතිශතය සියයට 36 ක් විය. ඒ අනුව හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රතිශතය පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

### 2.2.5 බලපත්‍ර ගාස්තු

--------------

සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ බලපත්‍ර ගාස්තු ශේෂය රු.227,000 ක් වූ අතර වර්ෂය තුලදී බිල් කිරීම රු.1,239,140 ක් සමඟ රු.1,466,140 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම රු.1,337,940 ක් වීම නිසා වර්ෂය අවසානයට රු. 128,200 ක හිඟ ශේෂයක් පැවතුණි.

### 2.2.6 දැන්වීම් පුවරු ගාස්තු

--------------------

සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 12 ක් වෙනුවෙන් අයවිය යුතු රු.316,500 ක් සමාලෝචිත වර්ෂය වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.



Scanned with CamScanner

### 2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් නිලධාරින්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට උසාවි දඩ රු.723,635 ක් හා මුද්දර ගාස්තු රු.36,086,509 ක් අය විය යුතුව තිබුණි.

### 2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) මාලිම්බඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ සුල්තානාගොඩ බටහිර ග්‍රාම නිලධාරි වසමේ සුල්තානාගොඩ පිහිටි ගුරුවලයාගොඩැල්ල හෙවත් කොබේමල්ලහේන නමැති පොදු කටයුතු සඳහා සභාව වෙත පවරා තිබූ ඉඩමෙන් සභාව සතු ජේ.සී.බී. යන්ත්‍රයෙන් අවිධිමත් ලෙස පස් ඝනමීටර් 82.5 ක් ඉවත් කර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඝනමීටර් 29.15 ක් සඳහා රු.67,045 ක් අයවී නොතිබුණි.

(ආ) විදුලි හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති අංක PR/01/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව වීථි පහන් ස්ථාපනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී වීථි පහන් නඩත්තුව සඳහා විදුලි උපාංග මිලදී ගැනීම වෙනුවෙන් රු.1,022,750 ක වියදමක් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

(ඇ) මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු කටුවන්ගොඩ ගංකන්ද මාර්ගයේ ගල්ගෙඩිය අසල පදිංචි අයෙකු මාර්ගයක් අවහිර වන සේ නිසි සංවර්ධන බලපත්‍රයක් නොමැතිව සිදු කර තිබූ ඉදිකිරීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසි ඇතුළත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ 02 වන උපලේඛනය ප්‍රකාරව ඉදිකිරීම විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.



Scanned with CamScanner

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

සභා බල ප්‍රදේශයේ එක්රැස්වන කසළ දිරන හා නොදිරන වශයෙන් වර්ග කිරීමකින් තොරව එක්රැස් කිරීම සිදු කරන බවත් දිරන කසළවලින් කොම්පෝස්ට් නිෂ්පාදනය සිදු කරනු ලබන අතර වර්ග කර ලබා නොගැනීම නිසා කසළ වර්ග කිරීම සඳහා සභාවේ කම්කරුවන් යොදවා තිබූ අතර නොදිරන කසළ බැහැර කරන ස්ථානය පස්වලින් යට කිරීම සිදු කර තිබූ අතර පරිසර හිතකාමී ලෙස බැහැර කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබූ බව නිරීක්ෂණය විය.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ රාජකාරි සිදු කරන දෛනික/ ආදේශක සේවකයින් වෙනුවෙන් සභාව විසින් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙනුවෙන් බැර කළ යුතු 3% දායක මුදල නිසි පරිදි නොගෙවීම නිසා 2013 අගෝස්තු මස සිට 2022 අගෝස්තු මස දක්වා කාලපරිච්ඡේදයට අදාලව රු.376,930 ක අධිභාර මුදලක් සභාව විසින් ගෙවීමට සිදුවී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැඟිලි වටිනාකම කාලීනව තක්සේරු කර වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.



Scanned with CamScanner

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රැකියා අපේක්ෂිත තරුණ තරුණියන් විදේශ රැකියාගත කිරීම සඳහා ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේදී ජපන් භාෂා පුහුණු පාඨමාලාවක් ආරම්භ කර සමාලෝචිත වර්ෂය අවසාන වන විට පාඨමාලාවේ සම්පත් දායක වෙත රු.148,000 ක් ගෙවා තිබූ නමුත් පාඨමාලාවේ අන්තර්ගතය හා පසුවිපරම් කටයුතු සිදු කර නොතිබුණි.

(ඇ) 2021 ජූනි 22 දින මාතර අකුරැස්ස ප්‍රධාන මාර්ගයේ දම්පැල්ල ගරාජය අසලදී කැබ් රථය අනතුරට පත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1642 හා 104 (3) (4) ප්‍රකාරව කටයුතු කර වගකිව යුත්තන් හඳුනාගෙන නොතිබුණි.

3.3 **මානව සම්පත් කළමනාකරණය**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සේවක සංඛ්‍යා සැලැස්මේ අතිරික්තව පවතින තනතුරු 28 විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබූ සේවකයින් 06 දෙනෙකු අදාළ බඳවා ගැනීමේ පටිපාටි අනුව අවම සුදුසුකම් සපුරා නොතිබූ අතර එසේ තිබියදී ඔවුන්ගේ සේවය ස්ථිර කර තිබුණි. ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 1:7 වැනි වගන්තියේ විධිවිධානවලින් බැහැරව සභාව විසින් අනුමත බඳවා ගැනීමේ පටිපාටිය යටතේ අදාල තනතුරට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති සේවකයින් දෙදෙනෙකු අනියම් පදනම මත බඳවා ගෙන තිබුණි.

(ඇ) සභාවේ වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් දෙදෙනෙකුට හා සෞඛ්‍ය කම්කරුවෙකු වෙත තනතුරට අදාළ නියමිත රාජකාරි පැවරීමකින් තොරව කාර්යාලයීය රාජකාරි හා වෙනත් රාජකාරි පවරා තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,246,076 ක මුදලක් සභා අරමුදලින් වැය කර තිබුණි.



Scanned with CamScanner

(ආ) සේවක ණය

සමාලෝචිත වර්ෂය අවසන් වන විට ස්ථාන මාරුවී ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 05 දෙනකුගෙන් අයවිය යුතු එකතුව රු.224,964 ක් වූ ණය ශේෂ අය කර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඉ) සේවක ඇප

සමාලෝචිත වර්ෂය අවසන් වන විට ස්ථාන මාරුවීගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 08 දෙනෙකු විසින් තැන්පත් කර තිබූ සේවක ඇප එකතුව රු. 28,836 ක ශේෂය අදාල පාර්ශවයන් වෙත නිරවුල් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

3.4 **වත්කම් කළමනාකරණය**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2018 මැයි 22 දිනැති අංක 55/03/12/05 දරන දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව ධාවනයෙන් ඉවත් කරන ලද සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ 02 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ධාවනයෙන් ඉවත් කරන ලද සභාව සතු ගල්රෝල වැලිගම ප්‍රාදේශීය සභාවේ අත්ට්‍රැක්ටරයක් සමඟ හුවමාරුව සඳහා එකඟතාව පල කර තිබුණද 2022 දෙසැම්බර් 15 දින සිදු කරන ලද ක්ෂේත්‍ර නියැදි විගණන පරීක්ෂාවේදී ගල්රෝල තෙලිජ්ජවිල පොළ භූමියේ ගාල් කර ඇති බව නිරීක්ෂණය විය.

3.4.1 **වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

2017 මාර්තු 19 දිනැති අංක දපස/15 දරන දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් ලිපිය ප්‍රකාරව පළාත් පාලන ආයතන සතු සෑම දේපළකටම වැට මායිම් දමා අනවසරයෙන් ඇතුළු වීමට නොහැකි වන සේ පවත්වා ගෙන යාමට සහ ගැටළු සහගත තත්ත්වයේ ඇති ඉඩම් මැන නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතු වුවද, සභාව සතු අක්කර 10 ක පමණ ඉඩම් කැබලි 37 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.



Scanned with CamScanner

3.4.2 පවරා නොගත් වත්කම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ස්වදේශ කටයුතු හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් සභාව වෙත ලැබී තිබූ (සභාවට ලද දිනය පිළිබඳ විස්තර ඉදිරිපත් නොවුණි.) කැබ් රථයක් විගණිත දිනය වන 2022 දෙසැම්බර් 16 දින වන විටත් සභාව නමින් ලියාපදිංචි කර සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවට අයත් රුඩ 06 ක පමණ වූ ඉඩම් කැබලි 03ක් හා භූමි ප්‍රමාණය නිශ්චිතව හඳුනාගෙන නොමැති එක් ඉඩම් කැබැල්ලක් සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5 අවිධිමත් ගණුදෙනු

2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 (iv) වගන්තිය ප්‍රකාරව වේලාව පදනම් කර ගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ආදී නිත්‍ය රාජකාරි වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කර ගන්නේ නම් එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් සනාථ කිරීම කළයුතු වුවත්, මාලිම්බඩ ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් පැමිණීම හා පිටවීම සනාථ කර නොගෙන දින 56 ක් වෙනුවෙන් නිලධාරීන් දෙදෙනෙකුට නිවාඩු දින වැටුප් ලෙස රු.122,108 ක් ගෙවා තිබුණි.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් සංවර්ධන වැඩ සටහන යටතේ රු.17,804,377 ක් ඇස්තමේන්තුගත වටිනාකම ඇති කර්මාන්ත 04 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.79,320,023 ක ගිවිසුම්ගත මුදලකට ටෙන්ඩර් කැඳවීම මගින්ද රු.3,926,611 ගිවිසුම්ගත මුදලකට අනුමත සමිතිවලටද කොන්ත්‍රාත් පිරිනමා තිබූ අතර ඉදිකිරීම් කර්මාන්ත 4 හි වැඩ නතරවන අවස්ථාව වන විට රු.3,626,711 නිමි වැඩ කොටසක් ඉටු කර තිබුණි. උක්ත කර්මාන්ත 4 හි ඉදිකිරීම නතර කිරීම හේතුවෙන් ඉදිකරන ලද කොටස් විනාශ වෙමින් පැවතුනු අතර ඉදිකිරීම් ආරම්භ කිරීම තුලින් බලාපොරොත්තු වූ අරමුණද ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රාදේශීය සභාවේ පොදු ජංගම ගිණුමෙහි රුපියල් මිලියන 23 ක පමණ



Scanned with CamScanner

සාමාන්‍ය මුදල් ශේෂයක් පැවති අතර රුපියල් මිලියන 22 ක ස්ථාවර තැන්පත් හා බැඳුම්කර ආයෝජනය කර තිබූ නමුත් සභාව විසින් මෙසේ අතරමඟ වැඩ අතහැර දැමූ කර්මාන්ත ඉටු කිරීමට අවධානය යොමු නොකර ආදාහනාගාරය ඉදිකිරීම වැනි වෙනත් ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමු කර තිබුණි.

## 4. ශිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයයන් 03 ක හිතකර විචලනයන්ගේ එකතුව රු.11,753,967 ක් වූ අතර, එම අගයන් සියයට 01 සිට සියයට 33 අතර පරාසයක පැවතුණි.

(ආ) ආදායම් විෂයයන් 04 ක අයවැයගත ආදායම සහ තථ්‍ය ආදායම ම අතර රු.7,171,737 ක අවාසිදායක විචලනයක් නිරීක්ෂණය වූ අතර, එම අගයයන් සියයට 03 සිට සියයට 59 දක්වා වූ පරාසයක පැවතුණි.

(ඇ) වියදම් විෂයයන් 05 ක හිතකර විචලනයන්ගේ එකතුව රු.12,074,327 ක් වූ අතර එම අගයන් සියයට 29 සිට සියයට 100 අතර පරාසයක් ගෙන තිබුණි.

(ඈ) වියදම් විෂයයන් 03 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.12,222,739 ක් වූ අතර , එම අගයන් සියයට 18 සිට සියයට 68 ක පරාසයක් ගෙන තිබුණි.

එච්.එම්. ද සොයිසා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල

එච්.එම්. ද සොයිසා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.



Scanned with CamScanner

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

144

මගේ අංකය / எனது இல. / My No. MTR/B/MaliPS/05/2021/87

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 ජුනි 20 දින

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
22 JUN 2022
මාලිම්බඩ 1391

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති කාර්යාලය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය,
ගාල්ල.

සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

කේ.එච්.යූ.ඩී. සරත් කුමාර,
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

පිටපත :- පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන කොමසාරිස් කාර්යාලය, ගාල්ල.

MPS/02/10



Scanned with CamScanner